# නවවන පරිච්ඡේදය

## තුලිත ආර්ථිකය සහ තිරසාර සංවර්ධනය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ගමන් මඟ සහ යොදාගත් උපායමාර්ග පිළිබඳවත්, වර්තමානයේ රට මුහුණ දෙන ආර්ථික සංවර්ධන අභියෝග මොනවාද යන්න පිළිබඳවත්, තුලනාත්මක විග්‍රහයක් කිරීම මෙම පරිච්ඡේදයේ මූලික අරමුණ වේ. එහිදී ඓතිහාසික වශයෙන් ලබාගත් අත්දැකීම් තුළින් වර්තමාන ආර්ථික සංවර්ධන මූලෝපායන් තීරණය කිරීමේදී උගත හැකි දෑ පිළිබඳව සළකා බලයි. අතීතයේ දී ස්වයංපොෂිත ආර්ථිකයක් වශයෙන් පැවත දිගු කලක් යටත්විජිත ග්‍රහණයට ලක්වූ රටක් වශයෙන් කටයුතු කර ඉන් නිදහස ලබා පරම්පරා දෙකකට (දශක හයක්) පසුව වර්තමාන ගෝලීය ආර්ථික සංවර්ධන අභියෝග ජයගැනීම උදෙසා විමසා බැලියයුතු විකල්ප සංවර්ධන ප්‍රවේශයන් මොනවාද යන්න පිළිබඳව තුලිත ආර්ථික සංවර්ධන දෘෂ්ඨියකින් කෙරෙන අවලෝකනයකි.

### අතීත අත්දැකීම්

ශ්‍රී ලංකාව ඈත අතීතයේ දී පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලියෙන් පිදුම් ලත් ඉංදියන් සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. ඓතිහාසිකව ලෝක ආර්ථිකයේ වෙළෙඳ කේන්ද්‍රස්ථානයක් වශයෙන් පැවැති බවට සාක්ෂි බොහෝය. පැරණි සේද මාර්ගය ඔස්සේ ඊසානදිග සුලඟ ආධාරයෙන් චීන වෙළෙන්ඳන් ද නිරිතදිග සුලඟ ආධාරයෙන් අරාබි වෙළෙන්ඳන් ද දිවයිනට පැමිණ තම වෙළෙඳ කටයුතු සාමකාමීව සිදුකර ඇත්තේ එවකට පැවැති විවෘත වෙළෙඳ ආර්ථික ක්‍රමය යටතේ විය හැකිය. එකී වෙළෙඳාමේ දී දේශීය වශයෙන් අතිරික්ත නිෂ්පාදන විදේශීය වෙළෙන්දන් විසින් ලබා ගත් අතර දේශීය වශයෙන් නිෂ්පාදනය නොකළ එහෙත් රටවැසියන්ට අවශ්‍ය ඇතැම් භාණ්ඩ විදේශීය වෙළෙන්දන්ගෙන් ලබා දී ගන්නා ලදී. මෙම භාණ්ඩ හුවමාරු ක්‍රියාවලිය හිඟයකින් හෝ අතිරික්තයකින් තොරව සිදුවීම සැබැවින්ම තුලිත ආර්ථිකයක් සතු මූලික ගති ලක්ෂණයකි.

බටහිර ජාතීන් විසින් යටත් විජිතයක් වශයෙන් දිවයින පාලනය කළ මුල් කාලසීමාවේ රට තුළ ද්විත්ව ආර්ථික ලක්ෂණ පෙන්නුම් කර ඇත. එනම් අපනයනය අභිමුඛ කරගත් වාණිජ භෝග වගාව සහ දේශීය අවශ්‍යතා සපුරාගැනීම වෙනුවෙන් සාම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මාන්තය යන අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක හා සම්බන්ධ නොවූ අංශ දෙකම එකවර ආර්ථිකයේ ක්‍රියාත්මකවීමයි. මෙම වකවානුවේ දී ගෝලීය වශයෙන් ආර්ථික අර්බුද සහ ආහාර අර්බුද පැවැතිය ද දේශීය ආර්ථිකයේ පැවැත්මට ඒවා එතරම් අභියෝග නොවීය. එහෙත් පසුකාලීනව දේශීය යැපුම් කෘෂිකර්මාන්තය කෙරෙහි යටත්විජිත පාලකයින්ගේ අවධානය යොමු නොකිරීම නිසා එතෙක් පැවැති දේශීය ස්වයංපෝෂිත ආර්ථක්‍රමය බිඳ වැටුණු අතර ආනයනය කරන ලද ආහාර ඇතුළු භාණ්ඩ හා සේවා මත යැපෙන පරාධීන ආර්ථිකයක් බිහිකරන ලදී. එය පාලකයින් විසින් තම යටත්විජිත පාලනය පහසු කරගැනීමේ උපායමාර්ගයක් වශයෙන් හිතා මතාම සිදුකරන ලද්දකි.

ශ්‍රී ලංකාව තුළ වතු වගාවේ නියුතු ඉන්දියානු සම්භවයක් ඇති කම්කරුවන්ට තම පරිභෝජනය වෙනුවෙන් ආනයනික ආහාර ඇතුළු විවිධ භාණ්ඩවලට හුරු කරවනු ලැබූයේ දේශීය ආහාර නිෂ්පාදනය අතිරික්තයක් පැවැති වකවානුවකය. බටහිර පාලකයන් විසින් දෙමළ වතු කම්කරුවන්ට හා උඩරට සිංහලයන්ට සහජීවනයෙන් ජීවත්වීමට ඇවැසි පසුබිම සකස් නොකිරීම, ඒ වෙනුවෙන් සානුබල ලබා නොදීම සහ

ස්වභාවිකව එවැන්නක් ඇතිවීමට පැවැති ඉඩකඩ පවා අසුරා දැමීම මගින් රටතුළ විසඳුම් ලබාදීමට ඉතා අසීරු ප්‍රශ්න රාශියක් නිර්මාණය කරන ලදී. එවැනි පසුබිමක් යටතේ ජාතීන් වශයෙන් වෙන්වෙන්ව කටයුතු කළ රටවැසියන් අතීතයේ දී පමණක් නොව වර්තමානයේ ද එකිනෙකා පිළිනොගැනීම තිරසාර සංවර්ධනය හමුවේ පවත්නා ප්‍රධාන සංරෝධකයකි. එකම රටක් තුළ ජාතීන් වශයෙන් බෙදවීමට එකී තත්ත්වය මූලික වශයෙන් ඉවහල් වුවා විය හැකිය. යම් හෙයකින් වතු කම්කරුවන්ට දේශීය නිෂ්පාදකයින් සමඟ යහපත් වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගෙන යාමට පාලකයින් විසින් අවස්ථාවන් ලබාදුන්නේ නම් මෙම තත්ත්වය බෝහෝදුරට වෙනස් වීමට ඉඩ තිබුණි. මෙවැනි පසුබිමක් තුළ ජාතීන් අතර සහයෝගීතාව සහ සහජීවනය වර්ධනය කිරීම අප හමුවේ ජයගත යුතුව පවතින ප්‍රධාන අභියෝගයක් වේ.

## විවෘත ආර්ථිකයට පෙර සහ පසු

ශ්‍රී ලංකාව වර්ෂ 1948 දී නිදහස ලබාගැනීමෙන් අනතුරුව ද එතෙක් පැවැති ආයාත නිර්යාත වෙළෙඳ ආර්ථික ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙයට සමගාමීව දේශීය යැපුම් කෘෂිකර්මාන්තයේ ප්‍රගමනය උදෙසා පාලකයින් විසින් විවිධ සානුබල ලබා දී ඇත. ඒ යටතේ ගොවිජනපද ව්‍යාපාරයට මූලිකත්වයක් ලැබුණි. වර්ෂ 1977 දක්වා රට පාලනය කළ විවිධ ආණ්ඩු යටතේ සාපේක්ෂව අඩු වැඩි වශයෙන් දේශීය ආර්ථිකය නගාසිටුවීම උදෙසා විවිධ ආර්ථික උපායමාර්ග අනුගමනය කළ ද පොදුවේ ගත්කළ අභ්‍යන්තරාවලෝකන ආර්ථික ප්‍රතිපත්ති ප්‍රමුඛ ක්‍රියාමාර්ග මෙහි දී කැපී පෙනේ. මෙම උපාමාර්ග යටතේ දේශීය වශයෙන් අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ විදේශීය වශයෙන් ආනයනය කිරීම් සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පැවැතුණි. ඒ බව 1970 සිට 1977 දක්වා පැවැති සමගි පෙරමුණ පාලන කාලයේ ආර්ථික කළමනාකරණ ක්‍රමෝපායන් පරීක්ෂා කිරීමේ දී තහවුරු වේ. අවාසනාවකට මෙන් එකී ආර්ථික ක්‍රමෝපායන්හි යහපත් අස්වැන්න ලැබීමට පෙර එකී ක්‍රමවේදය 1978 වන විට පාලකයින් විසින් අවසන් කරදමන ලදී (Dissanayaka A.,1997). එසේ නොකළේ නම් මෑත අතීතයේ ජීවිත සහ ලේ, මස්, කඳුළු, දහඩිය පරිත්‍යාගයෙන් ගණනය කළ නොහැකි තරම් විශාල කැපකිරීම් කිරීමට අවශ්‍ය නොවනු ඇත. අනෙක් අතට විසඳුම් ලබා දීමට ඉතා අසීරු විවිධ අර්බුද රටතුළ උද්ගත නොවනු ඇත. ඒ බව දේශහිතයිශීන් සහ බුද්ධිමතුන් විසින් බොහෝ අවස්ථාවන්වල දී ප්‍රකාශකර ඇත. උපන් දේශයට සහ අනාගත පරම්පරා කෙරෙහි ආදරයක් නොමැති බටහිර මත පමණක් නිවැරදි යයි සැමවිටම සිතූ පාලකයින්ගේ අදහස් පමණක් ක්‍රියාත්මක වීම නිසා තුලිත දේශීය ආර්ථිකයක් ගොඩනැගීමට තිබූ මහඟු අවස්ථාවන් රාශියක් රටට අහිමිකරවීම සහ රටවැසියන් තුළ පරාධීන මානසිකත්වයක් වර්ධනය කිරීම අප ලද පරාජයන් ලෙස හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකාව රටක් වශයෙන් යටත්විජිත පාලන සමයේත් ඉන් පසුවත් ආර්ථිකමය වශයෙන් ඉතා යහපත්ව පවත්වාගෙන යාමට උතුරු පළාත සහ නැගෙනහිර පළාත විශාල දායකත්වයක් ලබා දී ඇත. කෘෂිකාර්මික සහ ධීවර අංශයේ වාර්තාගත නිෂ්පාදන රටට හිමිකර දෙනු ලැබූයේ මෙම පළාත් දෙකිනි. එහි ප්‍රතිලාභ එම පළාත්වල නිෂ්පාදකයින් ඇතුළු ජනතාවට හිමිවිය. අවම පහසුකම් යටතේ නිෂ්පාදනය කරන ලද තම භාණ්ඩ අලෙවි කිරීම සඳහා දේශීය වෙළෙඳපොළින් කිසිම තර්ජනයක් හෝ බාධාවක් නොපැවැතුණි. එයට හේතු වූයේ දිවයින තුළ විවිධාකාර අභ්‍යන්තර අර්බුද පැවැතියත් වර්ෂ 1977 වන තෙක්ම ඒකීය රටක් වශයෙන් දේශීයත්වයට නැඹුරුව සියලුම ආර්ථික කටයුතු පවත්වාගෙන යාමයි. එහෙත් වර්ෂ 1978 න් පසුව ක්‍රියාත්මක වූ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හේතු කොටගෙන එතෙක් උතුරු හා නැගෙනහිර ජනතාවට හිමිව තිබූ වෙළෙඳපොළ අහිමි විය (Dissanayaka A.,1997).

විවෘත ආර්ථික ප්‍රතිපත්ති හේතුකොට ගෙන පළමුව දේශීය වෙළෙඳපොළ මත පැවැති රැඳියාව වෙනුවට විදේශ වෙළෙඳපොළ මත වඩාත් විශ්වාසය තබා කටයුතු කරනු ලබන අතරමැදි වෙළෙඳ ප්‍රජාවක් බිහිවිය. දෙවැන්න වන්නේ එකී වෙළෙඳ ප්‍රජාව තම ආනයනික භාණ්ඩ හා සේවා පරිභෝජනයට ගිජු පරාධීන පාරිභෝගික ප්‍රජාවක් රටතුළ බිහිකිරීමයි. මෙසේ වර්ධනය වූ විවෘත ආර්ථිකයේ අණිටු ඵල සමගම එතෙක් ජාතීන් වශයෙන් සහජීවනයෙන් කටයුතු කළ දේශීය වෙළෙඳ අර්ථිකය සපුරා වෙනස්විය. එකී තත්ත්වය හේතුකොට ගෙන පීඩාවට පත් උතුරු - නැගෙනහිර නිෂ්පාදකයින් සහ අතරමැදියන් තම අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග වෙත නැඹුරු විය. ඒ සඳහා බලපෑ තවත් ප්‍රධාන සාධකයක් වූයේ රටේ පැවැති දේශපාලනික පසුබිම සහ ප්‍රජාතන්ත්‍රවාදීව තම අපේක්ෂාවන් ඉටුවන බවට ඔවුන්තුළ විශ්වාසයක් නොපැවැතීමයි. එහි අනිටු ප්‍රතිඵලයක් වශයෙන් ආයුධ සන්නද්ධ බෙදුම්වාදී ද්‍රවිඩ කණ්ඩායම් බිහිවීමට හේතුවූවා විය හැකිය. පාරම්පරික උතුරු හා නැගෙනහිර ජන ජීවිතයට හානි සිදුකරමින් වර්ධනය වන නව ආර්ථික රටාව අනුමත නොකළ ඇතැම් ජන කොටස්හි ගැලවුම්කරුවා වශයෙන් පෙනී සිටිමින් තම වාර්ගික දේශපාලනික අරමුණු ඉටු කරගැනීම වෙනුවෙන් කටයුතු කළ ආයුධ සන්නද්ධ ද්‍රවිඩ කණ්ඩායම් ආරක්ෂාවීමටත්, වර්ධනයවීමටත් එකී පසුබිම හේතුවූවා විය හැකිය.

### විවෘත ආර්ථිකයේ ප්‍රතිවිපාක

වර්ෂ 1977 න් පසුව රටතුළ ක්‍රියාත්මක කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ එතෙක් පැවැති ජනතා හිතෛෂී වෙළෙඳපොළ ආර්ථික රටාව උඩු යටිකුරු කිරීමක් සිදුවිය. කෘෂිකාර්මික නිෂ්පාදන ඇතුළු බොහෝ භණ්ඩ හා සේවා විදේශිය වශයෙන් ආනයනය කරන ලදී. රටවැසියන් ද මෙම ආනයනික භාණ්ඩවලට ගිජුකරවූවා පමණක් නොව දේශීය නිෂ්පාදන සහ දේශීය නිෂ්පාදකයින්ව විනාශ කරදමන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ එතෙක් පැවැති සාරධර්ම හා ගුණධර්ම වලින් සමන්විතව පැවැති ජනතා හිතෛෂී වෙළෙඳපොළ ක්‍රමය විනාශ කරදමා ඒ වෙනුවට මුදල් සහ පෞද්ගලික ප්‍රතිලාභ මත පමණක් කටයුතුකරන වෙළෙඳපොළ හිතෛෂී ක්‍රමයක් බිහි කරන ලදී (Wickaramasinghe J. W.,1994).

තමන් අනුගමය කරන්නාවූ ක්‍රමවේදය පමණක් නිවැරදි යයි සිතූ පාලකයින් තම දේශපාලනික ස්ථාවරත්වය වෙනුවෙන් ජනතා පරමාධිපත්‍ය විනාශකර දමන ලදී. එහි ප්‍රතිඵල ලෙස රට තුළ ආදායම් බෙදීයාමේ විශාල විසමතාවක් වර්ධනයවීමත්, විරැකියාව සහ තරුණ අසහනය උත්සන්නවීමත් පෙන්වා දි හැකිය. මේ අයුරින් රටතුළ නෙසන්සුන්කාරී තත්ත්වයක් නිර්මාණය වීමට ඇවැසි පරිසරය සකසන ලදී. එහි ප්‍රතිඵලයවූයේ මිල කළ නොහැකි වටිනා තරුණ ජීවිත දහස් ගණනක් සහ මහජනයා සතු පොදු දේපොළ ඇතුළු භෞතික සම්පත් විශාල ප්‍රමාණයක් රටට අහිමිවීමයි. එමඟින් සිදුවූයේ රටවැසියන්තුළ පසුගාමී සහ පරාධීන මානසිකත්වයක් නිර්මාණය වීමය. පුරා දශක දෙකකට වඩා වැඩි කලක් යනතුරු එකී පරාධීන මානසිකත්වයෙන් ජනතාව මුදවා ගැනීමට නොහැකි විය.

තම නිෂ්පාදන වෙනුවෙන් දකුණින් වෙළෙඳපොළක් හිමිව සිටි උතුරු නැගෙනහිර නිෂ්පාදකයින්ට එය අහිමි වූයේ ද විවෘත ආර්ථික වෙළෙඳපොළ ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක වූ වෙළෙඳපොළ හිතෛෂී ක්‍රමය මගිනි. එහි භයානක ප්‍රතිඵල වසර කිහිපයකින් බුක්ති විඳීමට එය නිර්මාණය කළ රාජ්‍ය පාලකයින්ට පමණක් නොව සියලු රටවැසියන්ට ද සිදුවිය.

බලාපොරොත්තු කඩ වූ උතුරේ පිරිස් තම දේශපාලන අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් පළමුවෙන්ම තම දේශපාලන නායකයින් මරා දමන ලදී. එය ශිෂ්ට සමාජයේ පිළිගත නොහැක්කක් වුවද එකී භීෂණය වර්ධනය වීමට ඇවැසි පසුබිම

නිර්මාණය කර දී තිබීම අමතක නොකළ යුතුය. ක්‍රමයෙන් වර්ධනය වූ උතුරේ අවනීතිය නිවැරිදි කිරීමට තරම් හැකියාවක් දකුණේ පාලකයින්ට නොතිබුණි. පාලකයින් නිශ්චිත ඉලක්කයකින් තොරව විවිධ විකල්ප විසඳුම් සොයමින් බටහිරට ගැතිව කටයුතු කරමින් අවසානයේ දී අප සැමදෙනා ඉපදුණ සහ මියැදෙන මව්බිම දෙකඩ කිරීම දක්වා පවාදීම් සිදුකරන ලදී. පරාධීන මානසිකත්වයකින් සහ බටහිර මතයට ගැතිව කටයුතු කළ අය එකී විසඳුම පවා හිරිකිතියකින් තොරව අනුමත කරන ලදී.

මව්බිමට ආදරය කරන දේශප්‍රේමී රටවැසියන්ට දියසෙන් කුමරු පැමිණ මව්බිමට නිදහස උදාකර දෙන තෙක් වසර 30 කට ආසන්න කාලයක් තම ජීවිත ඇතුළු බොහෝ දෑ කැපකිරීමට සිදුවීම කිසිවිටෙකවත් ලඝුකර අමතක කර දැමිය නොහැකිය. එසේ කිරීමට පසුබට නොවන්නන් අප අතරම වෙස්මුහුනු බැඳ සිටින බව අමතක නොකළ යුතුය. එවැන්නක් සිදුවුවහොත් අළු යට ඇති ගිණිපුපුරු මෙන් සැඟව ඇති බටහිරට ගැති පරාධීන ආකල්පවලින් අපහට කිසි දිනක මිදිය නෙහැකි වනු ඇත. එම නිසාම එවැනි තත්ත්වයක් ඇතිවීමට හේතුවන්නා වූ සාධක සියල්ල මුලින් උපුටා විනාශ කර දැමීම අප සියලුදෙනා සතු පරම යුතුකම වන්නේය.

**බෙදුම්වාදයට පරාජය**

උතුර සහ නැගෙනහිර බෙදුම්වාදී ත්‍රස්තවාදීන් සහ ඔවුනට හිතවත් දේශීය මෙන්ම විදේශීය බලවේග විසින් වපුරන ලද විනාශකාරී බීජ මහ වෘක්ෂයන් බවට පත්ව තිබූ මොහොතක ඉන් රට මුදා ගැනීමත් සමඟම අභියෝගයන් රැසකට වර්තමානයේ දී මුහුණ දීමට අපට සිදුව ඇත. පුරා දශක තුනක් මෝරන ලද වර්ගවාදයට සහ බෙදුම්වාදයට විසඳුම් ලබාදීම පහසු කාර්යයක් නොවනු ඇත. ඒ වෙනුවෙන් එකී පළාත් හි වෙසෙන සියලු ජන කොටස් යළි නඟා සිටුවීමත් සමඟම බෙදුම්වාදයට සහ බටහිරට ගැති පරාධීනත්වයට සාර්ථක විසඳුම් ලබා දිය හැකිය. එවිට එකී ජනතාව දිනා ගැනීමට හැකිවනවා පමණක් නොව මව්බිමට ධරණීය සංවර්ධනයක් උදා කරගත හැකිය. ඒ සඳහා පක්ෂ, ජාති, ආගම් සහ කුල බේද පසෙකලා සියලු රටවැසියන් එකා වන්ව තම අනාගත පරම්පරා වෙනුවෙන් තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරීමට එක් සිත්ව බැඳී සිටීම අප සැමගේ පරම යුතුකම වනු ඇත. මේ සඳහා පවත්නා සංරෝධක මොනවාද යන්න හඳුනාගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ඊට සාර්ථක විසඳුම් කඩිනමින් ලබා දිය යුතුය. ඒ වෙනුවෙන් ඇවැසි පසුබිම සකස්ව ඇති මොහොතක අපගේ යුතුකම් මොනවාද යන්න හොඳින් අවබෝධකර ගැනීම සහ ඒ සඳහා කළයුතු කැපවීම ස්වාධීන ජාතියක් වශයෙන් අප විසින් තව තවත් පමා නොකළ යුතුය.

**සංවර්ධන අභියෝග**

රටක සංවර්ධනය උදෙසා මානව සහ භෞතික ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වන්නකි. එකී කටයුතු වෙනුවෙන් රටතුළ දේශපාලන ස්ථාවරත්වයක් පැවැතිය යුතුය. වර්තමානය වන විට ජනතාව විසින් රටට අවැසි දේශපාලන ස්ථාවරත්වය ලබා දී ඇත. දේශපාලන නායකත්වය ජනතා සිතුම් පැතුම් මෙන්ම මූලික, ද්විතීය සහ තෘතීය අවශ්‍යතා හොඳින් අවබෝධ කරගැනීමත් එවා ඉටු කිරීම වෙනුවෙන් ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් සම්පාදනය කිරීමත්, අවශ්‍යතා තරාව (අනුපිළිවෙළ) මත කඩිනමින් ඒවා ක්‍රියාත්මක කර ජනතාවට ඉන් ප්‍රතිලාභ ලබා දිය යුතුය. එහෙත් එය සිදුකළ හැකිවන්නේ ඒ වෙනුවෙන් රටවැසි සියලු දෙනාම තම වගකීම් සහ යුතුකම් මොනවාද යන්න හොඳින් අවබෝධ කරගැනීමත් ඊට සක්‍රීයව දායකවීමත් යන කරුණු දෙකම එකවර ක්‍රියාත්මක කිරීමෙනි.

දේශීය ආර්ථිකයක් ගොඩනැගීම වෙනුවෙන් මූලික බාධාවක්ව පවත්නා වර්තමාන පාර්ලිමේන්තු ව්‍යස්ථාව වෙනස් කිරීම සංවර්ධනය වේගවත් කිරීම වෙනුවෙන් අත්‍යාවශ්‍ය වූවකි. ඒ සඳහා හේතු කාරක වන කරුණු රාශියකි. මෙම පාර්ලිමේන්තු මනාප මැතිවරණ ක්‍රමය යටතේ ජනතා නියෝජිතයන් පත් කිරීම දාහතර වැනි සියවසේ ගෝත්‍ර යුගයක මානව හැසිරීම් හා සමාන වන බව සමාජ සහ මානව විද්‍යාඥයින් පෙන්වා දී ඇති කරුණකි. දිස්ත්‍රික්ක මනාප ක්‍රමය තුළ ඡන්ද දායකයා ගෝත්‍ර යුගයකට අයත් ජන සමාජයකට ගෙන ගොස් ඇත. ඔවුන් තම මනාපය ලබා දිය යුත්තේ රටට වැඩ කළ හැකියාව ඇති යහපත්, බුද්ධිමත්, කාර්යක්ෂම ජනතාව වෙනුවෙන් කැපවන සැබෑ නියෝජනත්වයක් වෙනුවෙනි. එහෙත් මෙම මනාප ක්‍රමය යටතේ බොහෝ ඡන්ද දායකයන් තම මනාපය ලබා දීමට තීරණය කරනුයේ තම පක්ෂය, තම ජාතිය, තම ආගම, තම කුලය ආදී කරුණු පාදක කර ගනිමිනි. මෙම තේරීම ගෝත්‍ර සමාජ ක්‍රමයකට සමාන නොවන්නේද යන්න සිතා බැලිය යුතුය.

වර්තමානයේ ක්‍රියාත්මක වන අනුපාත ඡන්ද ක්‍රමය යටතේ අපේක්ෂකයන් තමන්ට හිමි මනාප සංඛ්‍යාව වැඩි කරගැනීම වෙනුවෙන් සිය ප්‍රචාරක කටයුතු විවිධ උපායමාර්ග ඔස්සේ සිදු කරනු ලබයි. එය වැලැක්විය නොහැක්කකි. එම නිසාම පක්ෂයේ අනෙකුත් අපේක්ෂකයන් සහ ආධාරකරුවන් ඇතුළු සහයෝගය දෙනු ලබන කණ්ඩායම් අතර භේදවීම් ඇතුළු අමනාප පොරයක් බවට පත්ව ඇති බව ජනතාව හොඳින් දන්නා කරුණකි. මෙම මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් අති විශාල මූල්‍ය සම්පත් සම්භාරයක් මෙන්ම මානව සහ භෞතික සම්පත් ප්‍රමාණයක් ද කැප කිරීමට සිදුවීම සැබැවින්ම ශෝකජනකය. පියවි ඇසට විද්‍යාමාන වන විශාල ධනස්කන්ධයක් මහජන නියෝජිතයන් පත් කර ගැනීම වෙනුවෙන් අපේක්ෂකයන් ඇතුළු ආධාරකරුවනට ලැබුනේ කෙසේද යන්නද ප්‍රශ්නයකි. විවිධ මුහුණුවරින් වැය කරනු ලැබුවද සැබැවින්ම ඒවා රටේ මහජනයා සතු මුදල් විය යුතුය. මෙසේ වැය කරනු ලබන මුදල් නැවතත් විවිධාකාරයෙන් ජනතාව අතට පත්වන්නේ නම් එවිට රටේ ආදායම බෙදීයාමේ විසමතාව අඩු විය යුතුය. එහෙත් එය එසේ නොවන්නේ මන්ද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය.

රජය විසින් නියමිත කාලයට මහජන නියෝජිතයින් පත්කිරීම වෙනුවෙන් මැතිවරණ පැවැත්වීම රජය සතු වගකීමකි. එහිදී ප්‍රජාව පාලනය කිරීම සඳහා මහජන නියෝජතයින් ප්‍රජාව විසින් තෝරා පත් කර ගනු ලබයි. එම නිසාම මහජන නියෝජිතයන් පත්කිරීම වෙනුවෙන් රජය මහජන මුදල් වියදම් කරනු ලබයි. එහෙත් ගැටලුව වන්නේ රජයට මහජන නියෝජිතයන් පත් කිරීමේ වගකීම යටතේ මහජන මුදල් වැය කිරීම නොව, එකී මුදල් ප්‍රමාණය මෙන් අසූ ගුණයකට ආසන්න මුදල් සම්භාරයක් මහජන නියෝජිතයින් පත් කිරීමේ රජයේ කාර්යභාරය වෙනුවෙන් පෞද්ගලික අංශය විසින් වැය කිරීමයි. රජයේ කාර්යභාරය වෙනුවෙන් මෙතරම් සාපේක්ෂ ධනස්කන්ධයක් වැය කිරීමට තරම් ශක්තිමත් පෞද්ගලික අංශයක් ලොව කිසිම රටක සිටින්නේද යන්නද සොයා බැලිය යුත්තකි. එහෙත් ගැටලුව එය නොවනු ඇත. උක්ත කාර්යයන් වෙනුවෙන් පෞද්ගලික අංශය වැය කරනු ලබන මුදලින් ආසන්න වශයෙන් 80% ක පමණ ප්‍රමාණයක් මැතිවරණ කාල සීමාව තුළ දී විදේශ ගත වීමයි. නිදසුන් ලෙස ප්‍රචාරක පත්‍රිකා ඇලවීමට තිරිඟුපිටි විශාල ප්‍රමාණයක් අවශ්‍යවනු ඇත. ඒවා ආහාර වශයෙන් පරිභෝජනයකින් තොරව බිත්ති, තාප්ප, පාලම්, බොක්කු, විදුලිකනු ඇතුළු බොහෝ ස්ථානවල තවරනු ලබයි. එහෙත් මෙවා ගෙන්වනු ලබනුයේ විදේශයෙනි. එපමණක් නොව කඩදාසි, තීන්ත වර්ග, මුද්‍රණ ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත උපකරණ සියල්ලක්ම පාහේ ආනයනය කළ යුතුය. අඩි ගණන් උස විශාල ප්‍රචාරක පුවරු සහ තොරණ වැනි ප්‍රචාරක නිර්මාණ බිහිව ඇත. ඒ වෙනුවෙන් ද අති මහත් මුදල් ප්‍රමාණයක් විදේශ ගත වේ. අනෙක් අතට මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් ධාවනය කරන යාන වාහන හා මෝටර් රථ සඳහා ඉන්ධන මෙන්ම ඒවායේ අමතර කොටස් ගෙන්වනු ලබනුයේ ද විදේශයෙනි. තම මැතිවරණ කටයුතු වල නියැළෙන

ආධාරකරුවනට ආහාර වේලක් දෙන්නේ නම් එහි ඇත්තේද ආනයනය කරන ලද ද්‍රව්‍ය වනු ඇත. මෙසේ විශාල මුදල් සම්භාරයක් කෙටි කලක් ඇතුළත රටින් බැහැරවීම රටතුළ විදේශ විනිමය අර්බුද ඇති කරවන්නක් පමණක් නොව තුලිත ආර්ථිකයක් පවත්වා ගැනීම වෙනුවෙන් පවත්නා විශාල බාධාවකි.


අනෙක් කරුණ වන්නේ ඡන්ද දායකයින් අඩු මැතිවරණ බල ප්‍රදේශ නියෝජනය කරන අපේක්ෂකයින්ගේ මැතිවරණ බල ප්‍රදේශය සිය පක්ෂය ජයග්‍රහණය කළ ද ඔවුන් පරාජයට පත්වීමයි. එවිට එකී බල ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන ජනතා නියෝජිතයින් නොමැතිවීමෙන් ප්‍රදේශීය සංවර්ධනයේ විසමතාවන් සහ ව්‍යාකූලතාවන් ඇතිවීමෙන් ජනතා අපේක්ෂාවන් බිඳ වැටෙනු ඇත.

උක්ත තත්ත්වය හමුවේ පවත්නා මැතිවරණ ක්‍රමයේ වෙනසක අවශ්‍යතාව බුද්ධිමත් ජනතා නියෝජිතයින් පමණක් නොව මහජනතාව ද හොඳින් අවබෝධ කරගත යුතුය. ඒ සඳහා පවත්නා අනුපාත මැතිවරණ ක්‍රමය වෙනුවට රටට යහපත් ජනතා නියෝජන ක්‍රමයක් ඇති කළ යුතුය. එහෙත් එය සිදුවිය යුත්තේ තුලිත ආර්ථිකයක් බිහි කිරීමේ අරමුණු ඇතිව තිරසාර සංවර්ධනයක් වෙනුවෙනි.

**න්‍යායාත්මක ප්‍රවේශය**

වර්ෂ 1948 දී යටත්විජිත පාලනයෙන් නිදහස ලැබුවායින් පසුව වර්ෂ 1977 ට පෙර සහ පසු වශයෙන් පරම්පරා දෙකක අත්දැකීම් රාශියක් අප සතුව ඇත. 1977 ට පෙර පැවැතියේ සාපේක්ෂ වශයෙන් රජය ආර්ථික කටයුතු සඳහා ඍජුව මැදිහත්වන අභ්‍යයන්තරාවලෝකන රාජ්‍ය ව්‍යවසායී ආර්ථිකයකි. එහෙත් වසර 1977 ට පසුව සාපේක්ෂව පෞද්ගලික ව්‍යයසායී බාහිරාවලෝකන ආර්ථිකයක් බවට රට පරිවර්තනය කරන ලදී (Dissanayaka A.,1997). ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම නම් න්‍යායාත්මක උපකරනය මගින් මෙම යුග දෙකහි මූලික ආර්ථික මෙහෙයුම් හි ප්‍රතිඵල පිළිබඳව සළකා බැලිය හැකිය.

නිෂ්පාදන හැකියා මායිම ආශ්‍රීත විග්‍රහය




සටහන 8.01

සටහන 8.01 හි සිරස් අක්ෂය මගින් පෞද්ගලික අංශය (P) සහ තිරස් අක්ෂය මගින් රාජ්‍ය අංශය (G) නිරූපනය කරයි. අර්ථක්‍රමය සතු සියලුම නිෂ්පාදන සාධක සම්පත් උපරිමව රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතර බෙදාහරිමින් පවත්නා තාක්ෂණය යටතේ

නිෂ්පාදනය කළ හැකි විකල්ප නිෂ්පාදන අවස්ථාවන් A - B යන නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි a, b, c යන ලක්ෂ මගින් පෙන්වයි. ශුද්ධ සංවෘත නැතිනම් රාජ්‍ය ව්‍යවසායී ආර්ථිකයක් පවතින්නේ නම් අර්ථක්‍රමය සතු සියලුම නිෂ්පාදන සාධක රාජ්‍ය කළමණාකාරීත්වය යටතේ B නම් නිෂ්පාදන මට්ටමේ පවතිනු ඇත (පෞද්ගලික අංශයේ දායකත්වය 0 වේ). අනෙක් අතට ශුද්ධ විවෘත නැතිනම් පෞද්ගලික ව්‍යසායී ආර්ථිකයක් පවතින්නේ නම් අර්ථක්‍රමය සතු සියලුම නිෂ්පාදන සාධක පෞද්ගලික කළමණාකාරීත්වය යටතේ A නම් නිෂ්පාදන මට්ටමේ පවතිනු ඇත (රාජ්‍ය අංශයේ දායකත්වය 0 වේ). (මෙවැනි ස්වභාව ආර්ථික සංකල්පමය තත්ත්වයන් වන අතර ප්‍රායෝගිකව ලොව කිසිම රටක දැක ගත නොහැක).

ඉහත සටහන 8.01 මගින් නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද සංවෘත සහ විවෘත ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව සාපේක්ෂ වශයෙන් සළකා බැලිය හැකිය. ශ්‍රී ලංකා ආර්ථිකය නිදහස ලබන විට ඌණ උපයෝජනය තත්ත්වයක් යටතේ නිෂ්පාදන හැකියා මායිම ඇතුළත පිහිටි d වැනි ලක්ෂයක කටයුතු කර ඇත. වසර 1948 සිට විවිධ ආණ්ඩු යටතේ වසර 1977 දක්වා රාජ්‍ය ව්‍යවසායක ආර්ථික ක්‍රමෝපයන් ක්‍රියාත්මක කරන ලද්දේ d ලක්ෂයේ සිට හැකියා මායිම මත පිහිටි c ලක්ෂය වෙත ලඟාවීමේ බලාපොරොත්තු ඇතිව විය හැක. එවිට රාජ්‍ය අංශයේ නිෂ්පාදන දායකත්වය $G_3$ වන අතර පෞද්ගලික අංශයේ නිෂ්පාදන දායකත්වය $P_1$ ලෙස පවතිනු ඇත. එහෙත් එම ඉලක්කය වෙත දශක තුනක කාලයක් කැප කළද ලඟාවීමට නොහැකිවිය. වසර 1978 සිට විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ 2007 දක්වා සාපේක්ෂව පෞද්ගලික ව්‍යවසායක ආර්ථික ක්‍රමෝපයන් ක්‍රියාත්මක කරමින් හැකියා මායිම මත පිහිටි a ලක්ෂය වෙත ලඟාවීමට උත්සාහ දරන ලදී. ඒ යටතේ අපේක්ෂා කරනු ලැබූයේ පෞද්ගලික අංශයේ නිෂ්පාදන දායකත්වය $P_3$ වැනි ඉහළ මට්ටමක සහ රාජ්‍ය අංශයේ නිෂ්පාදන දායකත්වය $G_1$ වැනි පහළ මට්ටමක පවත්වාගෙන යාමයි. එහෙත් එම ඉලක්කය වෙත ද දශක තුනක කාලයක් තුළ ලඟාවීමට අප ආර්ථිකයට නොහැකිවිය. නිදහසින් පසු ගෙවන ලද මෙම පරම්පරා දෙක තුළ අපේක්ෂා කළ එහෙත් ලඟාවීමට නොහැකි වූ ඉලක්ක සපුරා ගනු ලැබුවද එමඟින් ලඟාවිය හැක්කේ $SWI_1$ සමාජ සුබසාධන උපේක්ෂා වක්‍රය මත පිහිටි සමාජ සුබසාධන මට්ටමකට පමණි (a සහ c ලක්ෂවලට අදාලව). (SWI මගින් දක්වා ඇත්තේ අර්ථක්‍රමයේ නැතිනම් සමාජයේම උපයෝගිතාව නැතිනම් සමාජ තෘප්ත මට්ටම නිරූපනය කෙරෙන සමාජ සුබසාධන උපේක්ෂා වක්‍රයයි).

ශ්‍රී ලංකා වැනි යටත් විජිතකරණයට ලක් වූ ඌණ සංවර්ධිත රටවල ඉහත ආකාරයේ ආර්ථික තත්ත්වයන් පැවැතීම පිළිබඳව ආර්ථිකවිද්‍යාඥයින් විසින් පර්යේෂණ ගණනාවක් සිදුකර ඇත (Dasgupta P. , 2001). එකී පර්යේෂණ මගින් පෙන්වා දී ඇත්තේ සංවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ c ලක්ෂය වෙත ලගවුවත්, විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ a ලක්ෂය වෙත ලඟාවුවත්, ආර්ථිකයට අත්පත් කරගත හැක්කේ $SWI_1$ වැනි පහළ සමාජ සුබසාධන මට්ටමක් බවයි. මෙකී a සහ c ලක්ෂ වෙත ගමන් කිරීමට කටයුතු කරනවා වෙනුවට රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව කටයුතු කර නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි b ලක්ෂය වෙත ගමන් කළ යුතුය යන්න විකල්ප සංවර්ධන මාදිලි (Alternative Development Models) පිළිබඳව අදහස් දක්වන ආර්ථිකවිද්‍යාඥයින් මතයයි (Dasgupta P., 2001). ඔවුන්ගේ මතයට අනුව ආර්ථිකය සිය ප්‍රතිපත්ති මෙහෙයවිය යුත්තේ d ලක්ෂයේ සිට b ලක්ෂය දක්වා ගමන් කිරීම උදෙසාය (මෙය විශාල තල්ලු න්‍යාය යටතේ පෙන්වා දෙනු ලබයි). මෙකී ක්‍රමවේදය ආර්ථිකවිද්‍යාඥයින් විසින් හඳුන්වා දී ඇත්තේ තුලිත ආර්ථික සංවර්ධන මාදිලිය නැතිනම් තුලන ආර්ථිකය (Balanced Economy) වෙනුවෙන් ප්‍රවේශය යනුවෙනි. මෙම ප්‍රවේශය යටතේ නිෂ්පාදන හැකියා මායිම මත පිහිටි b ලක්ෂයට පැමිණ $SWI_2$ නම් සමාජ සුබසාධන උපේක්ෂා වක්‍රය මගින් පෙන්වන ඉහළ සමාජ සුබසාධන මට්ටමක්

අත්පත් කරගැනීමේ හැකියාවක් පවතී. මෙම අවස්ථාවේදී A-B නිෂ්පාදන හැකියා මායිමේ සහ $SWI_2$ සමාජ සුබසාධන උපේක්ෂා වක්‍රයේ බෑවුම් එකිනෙකට සමාන වන අතර එය ආර්ථික සමතුලිත කොන්දේසියක් සපුරාලීමක් වනු ඇත (Andersson L. and B. Thomas, 1998).

**විකල්ප සංවර්ධන ප්‍රවේශය**

තුලිත ආර්ථිකයක් යනු අන් කිසිවකුට බරක් නොවී සියලු ආර්ථික කටයුතු සමබරව පවත්වාගෙන යාමයි. මෙය විකල්ප සංවර්ධන ප්‍රවේශ යටතේ හඳුන්වා දෙන ලද්දකි. යටත්විජිත වශයෙන් පැවැති බොහෝ රටවල තම සංවර්ධන උපායමාර්ග වශයෙන් තෝරාගනු ලැබුයේ බටහිර රටවල් අනුගමනය කළ සංවර්ධන ආකෘතීන් හා සංගතවය. එහෙත් එමඟින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා කරගැනීමට නොහැකි වු රටවල් රාශියකි. එසේ වීමට හේතු මොනවාද යන්න පිළිබඳව අධ්‍යයන කළ සංවර්ධන ආර්ථිකවිද්‍යාඥයින් විසින් තම රටේ ආර්ථික ව්‍යුහයට ගැළපෙන ආකාරයේ නව විකල්ප වෙත ප්‍රවේශ විය යුතු බව පෙන්වා දී ඇත. එමඟින් තිරසාර සංවර්ධනයක් නැතිනම් ධරණීය සංවර්ධනයක් අත්පත් කරගත හැකි බව ඔවුන්ගේ මතයයි (Dasgupta P. , 2001).

ගෝලීය අවශ්‍යතා සපුරාලීම යටතේ රටක "තුලිත ආර්ථික සංවර්ධනයක්" උදෙසා අත්පත් කර ගතයුතු මූලික තුලන අවශ්‍යතා තුනක් පිළිබඳව මෙහි දී අවධානය යොමුකළ යුතුය (Sterner T., 2003).

අභ්‍යන්තර තුලනය (Internal Balanced)

බාහිර තුලනය (External Balanced)

පාරසරික තුලනය (Environmental Balanced)

**අභ්‍යන්තර තුලනය**


අභ්‍යන්තර තුලනය යනු රටක් අභ්‍යන්තරික වශයෙන් එරට ආදායම සහ වියදම සමබරව පවත්වා ගෙන යාමයි. මෙය ආරම්භ කළ යුත්තේ පවුල නැතිනම් කුටුම්බය යන කුඩාම ආර්ථික ඒකකය තුළිනි (Dasgupta P., 2001). පවුලේ වියදම් පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් ආදායමක් සිය පවුල් ඒකකය තුළ පැවැතිය යුතුය. එසේ තම පවුලේ අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් ආදායම් නොලැබෙන කුටුම්බ පවුලේ ආදායම වර්ධනය කර ගැනීමේ උපායමාර්ග අනුගමනය කළ යුතුය. ඒ සඳහා පළමුවෙන්ම ගෘහ කළමනාකරණයක් සිදුවිය යුතුය. අඩු ආදායම්ලාභීන්ට තම පවුලේ ආදායම් වර්ධනය කර ගැනීමේ ප්‍රවේශයන් බිහි කිරීම මෙන්ම නිවැරදිව ගෘහ කළමනාකරණය නොවු කුටුම්බ ඒ වෙනුවෙන් යොමු කරවීම කළ යුතුය. මෙම ක්‍රියාවලිය සාර්ථක කරලීම උදෙසා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය වශයෙන් හිමි මානව සහ භෞතික සම්පත්හි විභවතාවන් නිවැරදිව හඳුනාගැනීම, එකී සම්පත් කළමනාකරණය සහ භාවිතය. ගෙවතු වගාව, ගෘහ කර්මාන්ත, නව වෙළෙඳපොළ ආකර්ශණය, අන්තර් සම්බන්ධීකරණය, අතරමැදි තාක්ෂණය ආදී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව පෙන්වා දිය හැකිය. අඩු ආදායම්ලාභීන්, සහනාධාර මත යැපෙන්නන්, රැකවරණය ඇවැසි පවුල්, හඬක් නැගීමට අපොහොසත් පිරිස්, හුදකලා සහ ආන්තිකකරණයට ලක්වූවන්, සවිබල ගැන්වීමේ විවිධ ව්‍යාපෘති ප්‍රදේශීය වශයෙන් අවශ්‍යතා හඳුනාගනිමින් ක්‍රියාත්මක කළ යුතුය.

කුටුම්බ ආර්ථිකය සමතුලිතයට පත්කිරීම පළමු කාර්යය වන අතර එවැනි කුටුම්බ රාශියකගෙන් ගමක් ද, එවැනි ගම් රාශියකගෙන් ප්‍රදේශයක් ද, එවැනි ප්‍රදේශ රාශියකගෙන් දිස්ත්‍රික්කයක් ද, එවැනි දිස්ත්‍රික්ක කිහිපයකින් පළාතක් ද, එවැනි පළාත් රාශියකගෙන් රටක් ද බිහි කිරීමෙන් එරට අය-වැය සමබරව පවත්වාගෙන යාමේ හැකියාව නිර්මාණය වනු ඇත. අභ්‍යන්තර තුලනය පවත්වා ගැනීම මගින් තිරසාර සංවර්ධනයයේ මූලික අවශ්‍යතා සපුරා ගත හැකි වන අතර එමගින් තුලිත ආර්ථිකයක් ගොඩනැගීමේ පළමු පියවර ඉටු වනු ඇත.

**බාහිර තුලනය**

බාහිර තුලනය යනු රටක් තම අන්තර්ජාතික වෙළෙඳාම සමබරව පවත්වාගෙන යාමේ ක්‍රියාවලියයි. රටකට ඇවැසි සියලූම භාණ්ඩ එරට තුළ නිෂ්පාදනය කිරීමේ ශාක්‍යතාවක් නොපැවතිය හැකිය (Sterner T., 2003). එමෙන්ම සාපේක්ෂ පිරිවැය වාසි හෝ තරඟකාරී පිරිවැය වාසි තත්ත්වයන් පදනම් කරගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම, පරිභෝජනය කිරීම, ආනයනය සහ අපනයනය කිරීම පොදුවේ සිදුවන්නකි. එම නිසාම රටවල් අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වේ. මෙම මූලධර්මය යටතේ බාහිර තුලනය යනු රටක ආනයන වියදමට සරිලන අපනයන ආදායමක් පවත්වා ගැනීමයි. ද්විමාන ජ්‍යාමිතික ආකෘතියක් මගින් බාහිර තුලන තත්ත්වය විග්‍රහ කළ හැකිය.

සාර්ව ආර්ථික සමතුලිතය




සටහන 8.02

සටහන 8.02 හි සිරස් අක්ෂය මගින් අපනයන එනම් දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ හා සේවා (X) සහ තිරස් අක්ෂය මගින් විදේශීය වශයෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා (M) නිරූපනය කරයි. ඒ අනුව $0\text{-}M_n$ ලෙස ආර්ථිකය සතු සියලූම සම්පත් භාවිතයෙන් ආනයනය කළ හැකි භාණ්ඩ හා සේවා ඒකක ප්‍රමාණය දක්වන අතර $0\text{-}X_n$ ලෙස රටේ සියලූම සම්පත් භාවිතයෙන් ආපනයනය කළ හැකි (දේශීය වශයෙන් නිපදවිය හැකි) භාණ්ඩ හා සේවා ඒකක ප්‍රමාණය දක්වයි. මෙවැනි $0\text{-}M_n$ සහ $0\text{-}X_n$ වැනි තිරස් සහ සිරස් අන්තයන් ලොව කිසිම රටක වර්තමානයේ නොපවතින අතර එය මෙම විග්‍රහය සඳහා යොදා ගන්නා සංකල්පමය තත්ත්වයක් පමණකි. එනම් මෙහි අදහස වන්නේ ලොව කිසිම ආර්ථිකයක් මෙම අන්තයක් දෙකෙහි කටයුතු නොකෙරෙන බවයි. සටහන 02 හි $X_n$ සහ $M_n$ යා කර ඇඳ ඇති

රේඛාව ආර්ථිකයේ අය-වැය රේඛාව වශයෙන් සළකා බලයි. මුල ලක්ෂයේ සිට $45^0$ ට ඇඳ ඇති රේඛාව ආදායම් පරිභෝජන රේඛාව නැතිනම් ආදායම් වියදම් රේඛාව (Income Expenditure Curve - IEC) ලෙස හඳුන්වයි. SWI යනු සමාජ සුබසාධන උපේක්ෂා වක්‍රය වේ. අය-වැය රේඛාවේ බෑවුමත්, SWI උපේක්ෂා වක්‍රයේ බෑවුමත්, k ලක්ෂයේ දී එකි නෙකට සමන වනු ඇත. එම අවස්ථාවේදීම IEC වක්‍රය ද k හරහා ගමන් කරයි. එය සාර්ව ආර්ථික සමතුලිතයට අදාල එක් කොන්දේසි සපුරාලීමකි (Starrett A. D., 1988),

මෙම සමතුලිතයට අනුව දේශීය වශයෙන් නිපදවා ආපනයනය කළ හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය $X_1$ වශයෙන් පවතින අතර එය අභ්‍යන්තර තුලනය (IB) මගින් දක්වයි. එකී අපනයන ආදායමින් ආනයනය කළ හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය $M_1$ වශයෙන් පවත්නා අතර එය බාහිර තුලනය (EB) වනු ඇත. මෙම විග්‍රහයට අනුව k මගින් රටකට සාර්ව ආර්ථික සමතුලිතයක් අත්පත් කර ගැනීමේ ඇති හැකියාව පෙන්නුම් කරයි. සුබසාධන ආර්ථිකවිද්‍යාඥයින් විසින් මෙහි k මගින් දක්වන අවස්ථාව ආර්ථිකයේ "ස්වර්ණමය ලක්ෂය" (Golden Point) වශයෙන් හඳුන්වයි. මෙසේ ආර්ථිකයක් අභ්‍යන්තර සහ බාහිර තුලන අත්පත් කර ගැනීම උදෙසා තම ආර්ථික ප්‍රතිපත්ති මොනවාද යන්න නිවැරිදිව හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කළ යුතුය. වර්තමාන සංවර්ධන ආර්ථිකවිද්‍යාඥයින් විසින් තුලිත ආර්ථිකයක් ගොඩනැගීමේ දී සපුරා ගතයුතු එක් කොන්දේසියක් වශයෙන් මෙම සමතුලිතය පෙන්වා දී ඇත (Starrett A. D., 1988),.

නව යටත්විජිතවාදයේ පොදු ලක්ෂණයක් වශයෙන් වර්තමාන ලෝක ආර්ථිකය තුළ සංවර්ධනය වෙමින් පවත්නා බොහෝ රටවල අපනයන ආදායමට වඩා ආනයන වියදම ඉහළ අගයක් ගෙන ඇත (Dissanayaka A., 1997),. බාහිර තුලනය යටතේ ආනයන වියදම් අවම කළ යුතුය. ඒ සඳහා විසඳුම් වශයෙන් රටට අත්‍යාවශ්‍ය ආනයන මොනවාද යන්න තීරණය කිරීම පළමු කාර්යය වනු ඇත. දෙවැන්න වන්නේ එකී ආනයන වියදමට සරිලන පරිද්දෙන් අපනයන ආදායම වැඩි කරගැනීමේ ක්‍රියාවලියයි. ඒ සඳහා එරට මානව සහ භෞතික සම්පත්හි විභවතාවන් නිවැරදිව හඳුනාගැනීම සහ භාවිතය මගින් නව අපනයන භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කළ යුතුය. එහි දී සම්ප්‍රදායික අපනයන මත දැඩි රැඳියාවක් නොදක්වීම සහ අපනයන භාණ්ඩ කිහිපයක් මත ආර්ථිකයේ රඳාපැවැත්ම තීරණය නොවන පරිදි කටයුතු කිරීම මගින් යහපත් ප්‍රතිඵල අත්කරගැනීමට හේතු වනු ඇත. මෙම මූලධර්මය යටතේ ගෙවුම් ශේෂ තුලනය මගින් රටකට ඇවැසි බාහිර තුලනයක් අත්පත් කරගත හැකිය. මෙම බාහිර තුලන ක්‍රියාවලිය ජයගැනීම සඳහා එරට ජනතාවට විශාල වශයෙන් කැප කිරීම් කිරීමට සිදුවනු ඇත. ඒ යටතේ විදේශීය වශයෙන් ආනයනය කරනු ලබන එහෙත් දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ ආනයන පාලනය කිරීම සහ එවැනි භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත්වීම ප්‍රධාන වනු ඇත. තරඟකාරී හෝ සාපේක්ෂ පිරිවැය වාසි තත්ත්වයන් යටතේ දේශීය වශයෙන් නිපදවිය හැකි භාණ්ඩ වර්ග හඳුන්වාදීම, නිෂ්පාදකයින් දිරිගැන්වීම සහ අවශ්‍ය සානුබල සම්පාදනය කිරීම සිදුකළ යුතුය.

**පාරසරික තුලනය**

පාරසරික තුලනය යන්න එක් රටකට හෝ රටවල් කිහිපයකට තම රාජ්‍ය ප්‍රතිපත්ති වලින් පමණක් අත්පත් කරගත නොහැක්කකි. ගෝලීය පරිසරය විවිධ පාරසරික සහ ස්වභාවික සම්පත් සමඟ ඒකාබද්ධව නිර්මාණය වී ඇත. එම නිසාම ඒවා අයිතිය පදනම් කරගනිමින් බෙදා තිබුන ද එක් මානව කොටසකගේ ක්‍රියාවන් මුළු මහත් මානව ප්‍රජාවටම දැනෙනු ඇත. එම නිසාම මානව අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් පාරසරික සම්පත් භාවිතයේ ප්‍රතිඵල ලඝුකර සැලකිය නොහැක. එකී අවබෝධය

නිසාම වර්තමානය වන විට ලොව බොහෝ රටවල් පරිසරය පිළිබඳව ඉතා අවදියෙන් කටයුතු කිරීමේ ප්‍රවනතාවක් දක්නට ලැබීම යහපත් ලක්‍ෂණයකි (Sterner T., 2003).

ලෝකයේ බොහෝ රටවල් 1980 දශකය වන තෙක්ම සාර්ව ආර්ථික සමතුලිතයක් මගින් තම සංවර්ධන ඉලක්ක වෙත ලඟා වීමට උත්සාහ දරා ඇත. එහෙත් 1990 දශකයේ ලෝවැසියනට මුහුණ දීමට සිදු වූ විශාලතම අභියෝගය වූයේ ගෝලීය පරිසරයේ සිදුවූ විපර්යාසයන්ය. මිනිසා විසින් තම අවශ්‍යතා සපුරා ගැනිම වෙනුවෙන් පරිසරයට සිදුකරන ලද බලපෑම්වල අනිටු ඵලවිපාක භුක්ති විඳීමට සහ ජයගැනීමට අපහසු ආකාරයේ අනාගත අභියෝග රැසකට මුහුණ දීමට අද අපට සිදුව ඇත. මිනිසා විසින් එකිනෙකා පරයා යාමට කරන ලද තාක්‍ෂණික විප්ලවය මෙයට හේතු විය. නවීණ යුධ ආයුධ නිපදවීම සහ ඒවා භාවිත කිරීම, ලෝක ත්‍රස්තවාදය ව්‍යාප්ත කරවීම, අධික ලෙස බලශක්තිය භාවිත කිරීම ආදිය ගෝලීය පරිසරයේ යහ-පැවැත්මට බාධා කරන සාධක කිහිපයක් වේ (Dasgupta P., 2001).

කෙසේ නමුත් මිනිසා සංවර්ධනයේ මිත්‍යාව පසුපස හඹායාම පාරිසරික අර්බුද වර්ධනය වීමට මුලිකම හේතුව වශයෙන් පෙන්වා දිය හැකිය. එමඟින් තම රටට ආවේනික සිරිත් විරිත්, පොදු සාරධර්ම, සංස්කෘතිය වැනි දෑ නැවත ගොඩනැගිය නොහැකි වන පරිද්දෙන් විනාශ වී ඇත. අනාගත පරම්පරාවන්හි අවශ්‍යතා පිළිබඳව කිසිදු තැකීමකින් තොරව වර්තමාන පරිභෝජනය මගින් පමණක් තම ඉලක්ක සපුරා ගැනීම තිරසාරත්වයක් නොමැති බව වටහා ගැනීමට කාලය එළඹ ඇත. මෙම අභියෝගයෙන් ලොව කිසිදු ජීවියකුට මිදීමට නොහැකි තත්ත්වයක් නිර්මාණය වී ඇත (Dasgupta P., 2001). මෙම එබැවින් රටක තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සකස් කිරීමේදී එරට පාරසරික තුලනය පවත්වාගත යුතු බව සංවර්ධන සහ පාරසරික ආර්ථිකවිද්‍යාඥයින් විසින් තරයේ අවධාරණය කරනු ලබන ප්‍රධාන කරුණක් වේ.

මිනිසා විසින් තම අවශ්‍යතා සපුරාගැනීම සඳහා පරිසරය සමඟ ගැටීමේ දී පරිසරයට කරන්නා වූ යහපත් සහ අයහපත් දෑ මොනවාද යන්න නිවැරදිව තක්සේරු කළ යුතුය. පරිසර හිතකාමී රටවල් තම වාර්ෂික ගිණුම්තුළට “හරිත ගිණුමක්” ඇතුළත් කර ඇත්තේ එකී අරමුණ වෙනුවෙනි. එමඟින් නිදහස් වෙළෙඳපොළ ක්‍රමයට හසු නොවන විවිධ බාහිරතා සඳහා සාර්ථක විසඳුම් ලබාදිය හැකිය. ඒ යටතේ සමාජීය වශයෙන් ජනනය වන යහපත් බාහිරතා මගින් වාසි උපරිම කර ගැනීමටත්, සමාජීය වශයෙන් ජනනය වන අයහපත් බාහිරතා මගින් අවාසි අවම කර ගැනීමටත් හැකි වේ. එමඟින් ගෝලීය වශයෙන් විනාශ වන්නා වූ පරිසරය ආරක්‍ෂා කරගත හැකිය. පාරසරික තුලනය මගින් අනාගත පරම්පරා වෙනුවෙන් යහපත් පරිසරයක් නිර්මාණය කළ හැකි වන අතර එමඟින් තිරසාර සංවර්ධන ඉලක්ක ජයගැනීම අපහසු නොවනු ඇත (Dasgupta P., 2001).

**සමාලෝචනය**

දශක තුනකට ආසන්න කාලයක් පුරා පැවැති රුදුරු ත්‍රස්තවාදී භීෂණයෙන් මව්බිම මුදා ගැනීමෙන් අනතුරුව දේශප්‍රේමීන් නැවුම් බලාපොරොත්තු සහිතව අලුත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම වෙනුවෙන් කැපවීම තුළින් ලොවට ආදර්ශමත් පණිවුඩයක් ලබා දී ඇත. සැබැවින්ම එය අගය කළ යුතු කරුණකි. පක්‍ෂ බේද, වර්ගවාදී ගෝත්‍ර සමාජ ක්‍රමයෙන් මිදීම අනිවාර්ය වූවකි. රටේ සංවර්ධනය වේගවත් කිරීම සඳහා මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් සාමකාමී, දැහැමි, නිවහල් රටක් යන්න යථාර්තයක් බවට පත් කිරීම අප සැමදෙනා සතු යුග වගකීමකි. තම දෙපයින් නැගීසිටීමටත්, තම කොන්දෙන් කෙළින්වීමටත්, තම බුද්ධියෙන් සිතීමට සහ කටයුතු කිරීමටත් හැකි ස්වාධීන ශ්‍රී ලාංකික ජාතියක් බිහි කිරීමේ අභියෝගය ජය ගැනීමට සියලු රටවැසියන්

එකාවන්ව තිර අධිටනින් කටයුතු කළ යුතුය. අප උපන් මාතෘභූමිය තුළ ජීවත්වීමට සමාන අයිතිය අප සියලුදෙනා සතුය. රටේ ජනාධිපතිවරයා අප සියළු දෙනාගේම රාජ්‍ය නායකයා වනු ඇත. ප්‍රජාව විසින් පත් කර ගන්නා ලද ව්‍යවස්ථාදායකයට අප සියළුදෙනා ගරු කළ යුතුය. අප මව්බිම ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමේ අභියෝගය යථාර්තයක් කිරීම වෙනුවෙන් සියලූම රටවැසියන් තම යුතුකම් සහ වගකීම් නොපිරිහෙලා ඉටු කළයුතු කාලය එළඹ ඇත. එකී ආකල්පය සහ චින්තනය මඟින් තුලිත ආර්ථික මාවතක් ඔස්සේ තිරසාර සංවර්ධනයක් අත්පත් කරගත හැකිය. එවන් කලක අප සැමට සුබ අනාගතයක් හිමි වීම ලොව කිසිවකුටවත් වැළක්විය නොහැකි වනු ඇත. එලෙස අප ලබාගන්නා වූ ජයග්‍රහණය ශ්‍රී ලාංකීය නව සංවර්ධන ආකෘතියක් ලෙස ලෝක ප්‍රජාව වෙත පසක් කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ නිර්දේශිත කියවීම්


Amanullah R.J., (1992), *Energy and Environmental Policy in the Developing Countries*, Environmental Protection Agency, Washington.

Andersson L. and B. Thomas, (1998), *Sustainability and Development*, Motala Grafiska Unit, University of Karlstad, Sweden.

Arrow K. J., (1976), *Social Choice and Individual Values*, Second Edition, John Wiley and Sons, New York.

Bergson A., (1938), "Reformulation of Certain Aspects of Welfare Economics", *Quarterly Journal of Economics*, 52, pp. 310-334.

Boadway W. Robin and Neil Bruce, (1984), *Welfare Economics*, Basil Blackwell Publisher Ltd., 108 Cowley Road, Oxford, England.

Dasgupta Partha, (2001), *Human Well-Being and the Natural Environment*, Oxford University Press Inc., New York.

Davis O. A. and A. B. Doel, (1995), "Welfare Economics and the Theory of the Second Best" *Review of Economic Studies*. 32. Pp. 01-14.

Dissanayaka A., (1997), Essays in Economics, "*Energy Consumption and Economic Growth Assessing the Evidence from Sri Lanka"*, Piyasiri Printing Systems, Nugegoda, Sri Lanka, pp. 211-232.

Freeman A. Myrick, (1999), *The Measurement of Environmental and Resource Values*, (Theory and Methods), Resources for the Future, Washington, D.C.

Hanemann M., (1991), "Social Choice, Welfare and Individual Values", *Journal of Economic Dynamic Control*, Vol. 12. New York.

Karunasena A.G., (1986), *Macroeconometric Model for Sri Lanka*, Central Bank of Sri Lanka, Central Bank Press, Rajagiriya, Colombo, pp. 01-44.

Karunathilake H.N.S., (1987), *The Economy of Sri Lanka*, Sridevi Printing works, Nadimala, Dehiwala, Colombo.

Randall, A., (1989), *Resource Economics*, Third Edition, John Wiley and Sons, SD 10662, New York.

Starrett A. David, (1988), *Foundations of Public Economics*, (Cambridge Economic Handbooks), (Reprinted), Cambridge University Press, New York.

Sterner T., (2003), *Policy Instruments for Environmental and Natural Resource Management*, Resources for the Future, The World Bank, Washington, D.C.

Wickaramasinghe J. W., (1994), "Poverty and Income Distribution in Last Dactes in Sri Lanka*" Economic Review*, Peoples Bank, Colombo.

Dr. D.M.Ajith Dissanayaka
Senior Lecturer
Department of Economics
University of Kelaniya
Kelaniya
Sri Lanka.
ajith@kln.ac.lk